ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි මණ්ඩලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනයන් දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 16 හි 15 ඡේදය ප්‍රකාරව මණ්ඩලයට අයත් ඉඩම් හෙක්ටයාර 11,893.55 ක වටිනාකම තක්සේරු කර දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර, හෙක්ටයාර 2,172.09 ක ඉඩම් ප්‍රමාණයක් ස්ථානීය ලෙස හඳුනා ගනිමින් පැවැත්ම තහවුරු කර ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.	තක්සේරුව ලබාගැනීම සඳහා විශාල මුදලක් වැයවන බැවින් වර්තමානයේ ඉඩම් බදුදීමේදී වාර්ෂික බදු කුලිය සඳහා පමණක් තක්සේරුව ලබාගනු ලබයි. ඒ සඳහා යන වියදමද බදුකරුගෙන් අයකර ගැනීමට ආයතනය විසින් කටයුතු කරනු ඇත.	ඉඩම තක්සේරු කර දේපල, පිරියත හා උපකරණ යටතේ හඳුනා ගැනීම කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කර එම අපේක්ෂිත අගයන් පසුගිය වර්ෂයට වඩා වෙනස් වන්නේ නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව කටයුතු කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට තවදුරටත් භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වටිනාකම රු.378,088,511 ක දේපල පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මෙම වත්කම්වල අවශේෂ හා ඵලදායී ජීව කාලය නැවත තක්සේරු ලබාගැනීම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව සඳහා තක්සේරු නිලධාරින් තෝරා පත් කර ගැනීම සඳහා ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත. මෙම කාර්යය සිදුකිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍යවන අතර, එම ක්‍රියාවලිය සිදුවීමෙන් අනතුරුව අදාළ තක්සේරු අගයන් ගිණුම්වලට ගැනීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් නැවත තක්සේරු කළ යුතුය.
(ඇ)	මණ්ඩලයේ 1783 ක කාර්ය මණ්ඩලයක් සේවා නියුක්තව සිටිය ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 වන ඡේදය ප්‍රකාරව සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ශිල්ප ක්‍රමය භාවිතා කර නොතිබුණි.	ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පාරිතෝෂික ගණනය කිරීම පෙර සිටම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව සිදුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුව විසින් පාරිතෝෂික හිඟ ගෙවීම් සම්බන්ධව කටයුතු සිදුකරනු ලබන්නේ මෙම පනතට අනුව බවද සඳහන් කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයු ගණන ශිල්ප ක්‍රමය අනුව සේවා ප්‍රතිලාභ ගණනය කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 07 ඡේදය ප්‍රකාරව බදු පදනම මත ලබා දී තිබුණු ඉඩම් හෙක්ටයාර 123,925.91 ක් සාධාරණ අගයට තක්සේරු කර ආයෝජිත දේපල යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ප්‍රාදේශිය වතු සමාගම් වෙත ලබාදී ඇති ඉඩම් සම්බන්ධ තොරතුරු 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ සටහන් තුළින් හෙළිදරව් කර ඇත. අනෙක් පාර්ශවය සඳහා බදු දී ඇති ජනතා	ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව බදු දී ඇති ඉඩම් ගොඩනැගිලි ආයෝජිත දේපල යටතේ ගිණුම්ගත කළ

		වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩම්වල වටිනාකම තක්සේරු කර නොමැති අතර, එසේ තක්සේරු අගයන් ලබා ගත් පසු ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත.	යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 හා 30 ඡේද ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් මැනිය යුතු වුවද, රු.21,938,031 ක් වූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ස්ථාවර අගයක් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. තවද සමාලෝචිත වර්ෂයේදී රු.29,225,917 ක ජීව විද්‍යාත්මක වත්කම් විකුණා ආදායමට ගෙන තිබුණද අදාල පිරිවැය වත්කම්වලින් ඉවත් කර නොතිබුණි.	2022, 2023 හා 2024 වර්ෂයන්හි දැව තක්සේරු වාර්තා වන සම්පත් අංශය විසින් ලබාගෙන ඇති අතර, එම වන සම්පත් අංශය විසින් ලබාදුන් දැව අගයන් හා ගස් ප්‍රමාණයන් සම්බන්ධව අදාළ වතුයායන් වෙත දන්වා ඇත. මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආයතනය තුළ ප්‍රායෝගික ප්‍රශ්ණ උද්ගත වී ඇත. එබැවින් ඉදිරියේදී නිවැරදි අගයන් පොත්වලට ගැනිමට කටයුතු කරනු ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු අතර විකුණු වත්කම්වලට අදාල පිරිවැය වත්කම් වලින් ඉවත් කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 30 හා 55 ඡේද ප්‍රකාරව 1996 වර්ෂයේ සිට පරිණත වෙනත් වගාවන් යටතේ දක්වා තිබුණු රු.8,281,946 ක් වූ ජීව විද්‍යාත්මක වත්කම් (Bearer Plants) සම්බන්ධයෙන් ක්ෂය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.	වත්කම්වල භෞතික පැවැත්ම අදාළ වතුයායෙන් තහවුරුව ලබාගෙන අදාළ ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරනු ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව වත්කම්වල පැවත්ම තහවුරු කර ක්ෂය කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පෙර වර්ෂ වල සිට පැවත එන භෞතිකව නොමැති වටිනාකම රු.3,350,076 ක් වූ සුළු අපනයන භෝග, ගිනිසිරියා වගාවන් හා වතුයායන් 08 ක රු.5,041,141 ක නොමේරූ වෙනත් ජීව විද්‍යාත්මක වත්කම්, කෙරීගෙන යන වැඩ යටතේ තවදුරටත් දක්වා තිබුණි.	මෙම සුළු අපනයන භෝගවල භෞතික පැවැත්ම සම්බන්ධයෙන් වතු අධිකාරිගෙන් තහවුරු ලබාගැනිම සඳහා කටයුතු කර ඇති අතර, එම තහවුරුව ලබාගැනිමෙන් අනතුරුව පොත්වලින් ලියාහැරිමට හෝ අදාළ ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරනු ඇත.	වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කර අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල සිදු කළ යුතුය.
(ආ)	වසර 20 කට වැඩි කාලයක සිට ජංගම නොවන වත්කම් වශයෙන් ගිණුම්ගතව පවතින රු.571,318 ක් වූ හන්තාන වතුයායේ ක්‍රීඩා පිටිය, ඩාලි පාරේ පිහිටි ගබඩා කාර්යාලය සහ පාරිභෝජ්‍ය අංශයට අයත් ගොඩනැගිලි තක්සේරු කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.	ආයතනයේ දිගින් දිගටම පවතින කාරක ප්‍රාග්ධන දුෂ්කරතා හේතුවෙන් 2002 වර්ෂයේ සිට 2023 ජුනි 30 වන දින දක්වා ව්‍යවස්ථාපිත ගෙවීම් පවා සිදුකර නොමැති තත්වයක ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කිරීමට ආයතනය සතුව ප්‍රමාණවත් මුදල් නොමැත. එබැවින් මෙම ස්ථාවර වත්කම්වල පැරණි අගයන් එලෙසම පොත්වල පවතින අතර ඉදිරියේදී මෙම ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.	වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	මොන්තක්‍රිස්තෝ වතුයායේ රු.32,168,955 ක් වූ දේපල පිරියත හා උපකරණ හා ජීව විද්‍යාත්මක වත්කම් ද, සමුච්චිත වටිනාකම රු.10,260,406ක් වූ ඕනුගල්ඔය වතුයායට අදාල ස්ථාවර වත්කම් සහ හරංගල සහ ටයිස්පේන් වතුයායේ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වත්කම් පවරා ගැනීමෙන් පසුව පරීක්ෂාවට ලක් කර නොතිබීමෙන් මෙකී වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. එනයින් මෙම වත්කම් ක්ෂය කිරීමට ද කටයුතු කර නොතිබුණි.	මොන්තක්‍රිස්ටෝ වතුයායේ වත්කම්වලට අදාළව ලිපි ලේඛන නොමැති බැවින් මෙම වත්කම් ක්ෂය කිරිම සිදුකර නොමැති අතර, මෙතෙක් මෙම වත්කම්වල පැවැත්ම පිළිබඳ තහවුරු කරගැනිමටද අපහසු වී ඇත. තවද, ඕනුගල්ඔය වත්ත මහවැලි ව්‍යාපෘතිය නිසා යටවීම හේතුවෙන් ඊට අදාළ ස්ථාවර වත්කම්වලද භෞතික පැවැත්මක් නොමැත. හරංගල වතුයාය එහි කර්මාන්ත ශාලාව සමඟ මේ වනවිට ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගින් බදු දිමට කටයුතු කර ඇති අතර, දේපළ සහ ගොඩනැගිලි වලට අදාළ විස්තරාත්මක තොරතුරු සොයාගැනීමට නොහැකි වී ඇත.	වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරගෙන ක්ෂය කිරීම් සිදු කළ යුතුය.
(ඈ)	නාගස්තැන්න වතුයායේ “වැවිලිකරුවන්ගේ බංගලාව” සඳහා දරන ලද වියදම් හා ගොඩනැගිල්ල කුළියට දීමෙන් සමාලෝචිත වර්ෂය තුළ ජනිත වූ රු.1,468,199 ක ශුද්ධ අලාභය, ලාභ අලාභ ගිණුමට ගැලපීම් නොකර විවිධ ණයගැති ශේෂයන් ලෙස ගිණුම්ගත කර තිබුණි.	මෙය 2025 දෙසැම්බර් 31 දින නිවැරදි කර ඇත.	ගිණුම්කරණ මූලධර්ම වලට අනුව ගිණුම් නිවැරදි කිරීම් කළ යුතුය.
(ඉ)	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබුණු “වතු සංවර්ධන ව්‍යාපෘතිය” 2010 වර්ෂයේදී අවසන් කර තිබුණද, එම ව්‍යාපෘතියට අදාලව සෙවිලි තහඩු මිලදී ගැනීම සඳහා මණ්ඩලය විසින් වැය කරන ලද රු.4,136,733 ක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙනත් ලැබිය යුතු ශේෂයක් ලෙස වර්ෂ 14 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. මෙම ශේෂය ප්‍රතිපූරණය විය යුතු ආයතනය හඳුනාගෙන නොතිබුණු අතර අයවීම අවිනිශ්චිතාවය පිළිබඳව කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘති 2010 දී අවසන් වී ඇති අතර, එම ආයතනය දැනට ක්‍රියාත්මක නොවන, බැවින් එම මුදල නැවත අයකර ගැනිමේ හැකියාවක් නොමැත. 2026 වර්ෂයේදි මෙම පැරණි ශේෂ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය මත ගිණුම් වලින් ඉවත් කිරිමට කටයුතු කරනු ඇත.	ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර අයවීම අවිනිශ්චිතාවය පිළිබඳව අඩමාණ ණය ප්‍රතිපාදනයන් සිදු කළ යුතුය.
(ඊ)	හන්තාන වතුයායට අයත් අක්කර 01 පර්චස් 1.3 ක පිහිටි තේ කර්මාන්තශාලාව හා ඉඩම 2001 ජනවාරි මස 01 දින සිට වර්ෂ 30 ක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බදු දී තිබුණි. ආරම්භයේ සිට මේ දක්වා වසර 23 ක කාලය තුළදී ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු රු.46,314,100 ක බදුකුලිය අය වී නොතිබූ අතර එම ලැබිය යුතු බදු කුලිය ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.	අදාළ තොරතුරු ඉඩම් අංශයෙන් ලබාගෙන ඉදිරියේදි ගිණුම් ගත කිරිමට කටයුතු කරනු ඇත.	ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු බදු මුදල් අයකර ගිණුම්ගත කළ යුතුය.

(උ)	මණ්ඩලයේ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් තුළ ඇතුළත් නොමේරූ රබර් වගාව සඳහා 2003-2014 කාලය තුළ වැයකර තිබුණු රු.29,599,058 ක් අවුරුදු 7 කින් පසුව පරිණත රබර් වගාවට මාරු කලයුතු වුවද, සමාලෝචිත වර්ෂය වන විට වසර 10 කට අධික කාලයක් ගත වී තිබුණ ද පරිණත වගාවට මාරු කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම නොමේරු රබර් වගාව තුළින් 2025 වර්ෂයේදී පරිණත වගාවට රු.13,230,467ක් මාරු කර ඇති අතර, භෞතිකව නොපවතින ප්‍රමාණය රු.1,043,256 කි.	පරිණත කාලසීමාව තුළදී වගාවන් පරිණත වගාවට මාරු කිරීමටත් භෞතිකව නොමැති වගාවන් නිසි ක්‍රමවේදයට ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	වතුයායන් 11 කට අදාල රු.2,761,476 ක් වූ තේ තොග සහ තේ පැළ තොගය භෞතිකව නොමැති වුවද, තොගය තුළ ඇතුළත්ව තිබුණි.	මෙම තේ තොග හා තේ පැල තොග නොමැති බවට අභ්‍යන්තර විගණන තහවුරුව ලැබීමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරනු ඇත.	භෞතික පැවැත්මක් නොමැති තොග ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	මණ්ඩලයේ මුල්‍ය ප්‍රකාශන තුළ වෙනත් ජීව විද්‍යාත්මක වත්කම් පිරිවැය රු.17,925,652 ක් වුවද, පිරිවැය ඉක්මවා ක්ෂය කිරීමට කටයුතු කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ සමුච්චිත ක්ෂය වටිනාකම රු.18,520,206 ක් වී වත්කමේ ශුද්ධ පොත් අගය රු.594,554 ක සෘණ ශේෂයක්ව පැවතුණි.	මෙම ශේෂ 1996 ට පෙර සිට පැවත එන බැවින් එම ශේෂ තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි නොමැත.	වත්කම් පිරිවැය ඉක්මවා ක්ෂය කිරීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඒ)	හලාවත වැවිලි සමාගම 2019 වර්ෂයේ සිට මණ්ඩලය සතු ගොඩනැඟිල්ලක කාර්යාලයක් සහ අලෙවි සැළක් කිසිදු ගෙවීමකින් හා ගිවිසුමකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණු අතර, 2019 සිට 2024 වර්ෂය දක්වා රජයේ තක්සේරුව අනුව ගණනය කර තිබූ ලැබිය යුතු බදු කුලී ලෙස රු.13,659,354 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතු යැයි හඳුනාගෙන තිබුණද, එම මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2019 සිට 2023 වර්ෂය දක්වා හලාවත වැවිලි සමාගම බිම් මහලේ පවත්වා ගෙන ගිය කාර්යාල සහ අලෙවි සැල සම්බන්ධයෙන් මෙතෙක් ගිවිසුමකට එළඹ නොමැත. ඒ පිළිබඳව ලිඛිතව ගිණුම් අංශය දැනුවත් කිරිමක් 2025 නොවැම්බර් 25 වන දින නියෝජ්‍ය සභාපති මගින් අදාළ ආයතනය වෙත දැනුම් දී ගිණුම් අංශය වෙත පිටපත් කර ඇති බැවින් 2025 දෙසැම්බර් 05 වන දින මෙය ගිණුම් ගත කිරිමට කටයුතු කර ඇත.	මණ්ඩලයේ දේපල භාවිතා කරන සියලු පාර්ශවයන් සමග බදු ගිවිසුම් ඇතිකර ගැනීම හා ඒ අනුව බදු මුදල් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඔ)	ලුල්කඳුර වතුයායේ සවිකිරීම සඳහා ඉන්ධන ටැංකියක් මිලදී ගැනීමට 2022 සැප්තැම්බර් 28 දින ගණුදෙණුකරු වෙත ගෙවා තිබුණු රු.1,614,000 ක් වූ අත්තිකාරම් මණ්ඩලයේ කෙරීගෙන යන වැඩ ලෙස සටහන් කිරීම නිසා මුල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණු අතර 2026 ජනවාරි 01 දින වන විටත් ඉන්ධන ටැංකිය මිලදී ගෙන ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම ඉන්ධන ටැංකිය 2026 ජනවාරි 07 වන දින කුමාරවත්ත වතුයාය වෙත ලබාදී ඇති අතර, එමනිසා මෙම ලුල්කඳුර වතුයායේ පවතින කෙරීගෙන යන වැඩ යටතේ සටහන් කර ඇති අතර රු.1,614,000ක මුදල කුමාරවත්ත වතුයාය වෙත මාරු කර 2026 වර්ෂයේ ගිණුම් වලට ගන්නා ලෙස දැනුවත් කර ඇත.	ඉන්ධන ටැංකිය ස්ථාපිත කිරීමට කටයුතු කර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂය	මුල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව වෙතින් මණ්ඩලයට ලැබිය යුතු ණය හා පොලී ශේෂය	97,709,342	117,039,582	19,330,240	ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව වෙතින් වතු සංවර්ධන මණ්ඩලය වෙත ලැබිය යුතු ණය ශේෂය රු.119,318,456 ක් විශ්ලේෂණය කර මණ්ඩලයට ලෙජර් ගිණුම් පිටපතක් එවා තිබුණද තොරතුරු ප්‍රමාණවත් නොවන නිසා සංස්ථාවේ තොරතුරු සමග සත්තේක්ෂණය කළ නොහැක.එමෙන්ම වැව්ලි සංස්ථාව වෙතින් ලැබිය යුතු ණය ශේෂය රු.119,318,496ක් වුවද වැව්ලි සංස්ථාව වෙත ගෙවිය යුතු මුදල් රු.2,278,914 ක් හිලව් කිරීම හේතුවෙන් ශේෂය රු.117,039,582 ක් වී තිබුණි.	රාජ්‍ය වැව්ලි සංස්ථාව සමග ශේෂ සැසදීම් කර නිවැරදි ශේෂය හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.4 අවිනිශ්චිත ගිණුම්

විෂය	මුදල රු .	අවිනිශ්චිත ලෙස තිබු කාලය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් පැරණි අවිනිශ්චිත ගිණුම් ශේෂයට අදාල ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	1,863,756	වසර 28	ප්‍රධාන කාර්යාලයේ රු.1,863,756 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය 1996 වර්ෂයට පෙර ශේෂයන් වන අතර, මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනිමට නොමැති නිසා පොත්වලින් කපා හැරිම සිදුකල නොහැකි වී ඇත.	අවිනිශ්චිත ගිණුමට අදාල ගණුදෙනු නිවැරදිව හඳුනාගෙන නිවැරදි කළ යුතුය.

1.5.5 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ දේපල පිරියත හා උපකරණ ශේෂය තුළ ඇතුළත් ප්‍රධාන කාර්යාලයේ ඉඩම්, ගොඩනැඟිලි සහ වතුයායන්ගේ ගොඩනැඟිලි, වෙනත්	ප්‍රධාන කාර්යාලයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස සඳහන් කර ඇති ප්‍රධාන කාර්යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි රු. 1,543,300,120 හි	ඉඩම්,ගොඩනැගිලි සහ අනෙකුත් දේපලවල අයිතිය හා පැවැත්ම තහවුරු කිරීම සඳහා

ශේෂයන්, ජල සම්පාදන ව්‍යාපෘතියෙහි ශේෂය ලෙස භෞතිකව පවත්නා එකතුව රු.1,570,107,697 ක දේපල වන නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීම සඳහා ඉඩම්වල ඔප්පු හා පිඹුරුපත් නොතිබුණි. 2008 වර්ෂයෙන් පසුව වටිනාකම් නැවත තක්සේරු කර නොතිබීමෙන් ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම් ගිණුම් මඟින් නිරූපණය කර නොතිබුණි.	ඇතුළත් රු. 1,489,375,963 පිළිබඳ ආයතනය සතු විස්තරාත්මක තොරතුරු 2020 කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට පිළිතුරු ලෙස ලබා දී ඇත. ප්‍රධාන කාර්යාල මෙන්ම වතුයායන්හි ගොඩනැගිලි ද මෙතෙක් තක්සේරු කල වටිනාකම් ලබාගෙන නොමැති බැවින් මෙම ගොඩනැගිලිවල වර්ග අඩි ප්‍රමාණය, ඉංජිනේරු සැලසුම් හා තක්සේරු වාර්තා ලබාගැනිමට නොහැකි වී ඇත. මෙම වටිනාකම තුළ වූ රු.39,770,818 ක ශේෂය පොත්වල දිගින් දිගටම පවතින ශේෂයකි.	ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර වත්කම් නැවත තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය.

1.5.6 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අඛණ්ඩව අලාභ ලැබීම මත සහ මණ්ඩලයේ දේපල, පිරියත හා උපකරණ වර්තමාන තක්සේරුවට නොමැතිවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.1,343,526,831 ක් හා රු.2,212,614,116 ක සෘණ අගයන් ගෙන තිබුණු අතර එදිනට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් රු.2,223,880,147 ක් වී තිබුණි.මෙම බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයන්ද සිදුකර නොතිබුණු අතර පියවිය යුතු බැංකු ණය ශේෂය රු.126,487,116 ක් වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 25 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය වුවද,මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 2.4 මගින් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබූ ප්‍රතිසංවිධානය ද 2026 මාර්තු 19 දින දක්වා සිදු කර නොතිබුණි.	මණ්ඩලය සතුව පවතින ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනයක් සිදුකර එම අගයන් පොත් වලට නොගැනිමට නොහැකි වී ඇත්තේ ආයතනයේ දිගින් දිගටම පවත්නා කාරක ප්‍රාග්ධන ඌනතාවයයි. එම හේතුව නිසාවෙන්ම මෙහි සඳහන් ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට පවා නොහැකි වී ඇති බවත් සඳහන් කරමු. එසේම වරින් වර වර්ෂයෙන් වර්ෂයට මහා භාණ්ඩාගාරයෙන් ලැබු මුදලින් මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම් සිදුකර ඇත. 2024 මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.4 මගින් දක්වා ඇති ප්‍රතිසංවිධාන කටයුතු එක් එක් දේශපාලන අධිකාරින්ගේ වෙනස් වීම සමග එක් එක් අදාළ ප්‍රතිසංස්කරණයන් සිදුකරන බව දැන්වුවද මේ දක්වා එවැන්නක් සිදු වී නොමැත.	මණ්ඩලය සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනයක් සිදුකර එම අගයන් පොත් වලට ගැනීමටත් ආයතනයේ දිගින් දිගටම පවත්නා කාරක ප්‍රාග්ධන ඌනතාවයයන් මගහරවා ගැනීමට උපාය මාර්ග සකස් කර ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මණ්ඩලය ප්‍රතිසංවිධානයන් කල යුතුය.

1.5.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල (රු).	නොසැපයු සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පාරිභෝගික අංශයේ පැරණි ණය ගැති ශේෂය,	95,031,236	ශේෂ සනාථන,ණයගැති	මෙම අගයන් පෙර වර්ෂ වල සිට මූල්‍ය	ශේෂ තහවුරු කර හිඟ ශේෂ අයකර

	මොන්ත ක්‍රිස්ටෝ වතුයායේ වත්කම් හා වගකීම්වලට අදාල පාලන ගිණුමේ ශේෂය, ලැබිය යුතු රඳවාගත් බදු සහ එකතු කළ අගය මත බදු, වෙළඳ ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් ගැලපුම් ශේෂය		කාල විශ්ලේෂණ, භෞතික සත්‍යාපන වාර්තා, විස්තරාත්මක උපලේඛන සහ ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග	ප්‍රකාශන තුළ ඉදිරියට ගෙනයමින් පවතින අතර ඒ ඒ කාලපරිච්ඡේද වලට අවශ්‍ය තොරතුරු සොයා බලා ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ගැනීමට හා හඳුනාගත නොහැකි ශේෂ සඳහා සුදුසු හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	පැවරුණු වෙනත් ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය	38,912,523	භෞතික සත්‍යාපන වාර්තා, ගස් සංගණන වාර්තා සහ වටිනාකම තක්සේරු කිරීමට අදාල වාර්තා	මෙම වටිනාකම තුළ වූ රු.17,925,652ක ශේෂය 1996 පෙර සිට පැවත එන ශේෂයක් වන අතර, ඉදිරියේදි අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත පොත් වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත. රු.7,859,380ක ශේෂය භෞතිකව නොපවතින බවත්, රු.13,127,491 ක පරිනත රබර් වගාවට මාරු කිරීමට කටයුතු කරනු ඇත.	වත්කම්වල පැවැත්ම, වටිනාකම නිවැරදිව හඳුනා ගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව, පුද්ගලික ආයතනයට ගෙවිය යුතු ශේෂය, මහවැලි නිවාස ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය, කල්බදු වත්කමට එරෙහිව තැන්පතු, ගෙවිය යුතු බදු, එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තු, උපයන විට ගෙවන බදු සහ ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා වේතන ශේෂය, බැංකු ණය, වෙනත් තැන්පතු, වෙනත් ණයහිමි ශේෂය	526,532,378	ශේෂ සනාථ කිරීමේ ලේඛන, කළ වැඩ වාර්තා සහ සහතික කළ බිල්පත්, තැන්පතුවලට අදාල ලදු පත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙන් ලද සහන කාලසීමාවන්, කාලීන ගෙවීම්වලට අදාල වවුචර්පත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය,ණය ලබාගත් දින වකවානු, ණය ගිවිසුම්,ණය මුදල, වාරිකය සමග පොළිය සහ ණය ගෙවීම් විස්තර	මෙම ශේෂ 01/2021 චක්‍රලේඛය අනුව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගෙන පොත්වලින් ඉවත් කිරීමට ඉදිරියේදි කටයුතු කරනු ඇත. බදුකරුවන්ගේ ගිණුම්වල පවතින දෝෂ නිසාද බැර ශේෂයක් පෙන්නුම් කර ඇත. ඉදිරියේදි මෙම ගිණුම සත්තේක්ෂණය කටයුතු කරනු ඇත.	සත්‍යාපනය කළ නොහැකි ශේෂ අදාල චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම්වලින් ඉවත් කිරීමටත් ගෙවිය යුතු ගිණුම්වල සිදුව ඇති වැරදි නිවැරදි කර නිවැරදි වටිනාකමට ගිණුම්වල ඉදිරිපත් කිරීමත් කළ යුතුය.

(ඇ)	වෙනස් නොවන පැරණි පොදු සංචිත ශේෂය, වැව්ලි සංවර්ධන ව්‍යාපෘතිය	295,796,203	ප්‍රදාන හිමි වූ වර්ෂය,ලබා දුන් අරමුණු හා භාවිතය සහ ලබාදුන් පාර්ශවය, කළ වැඩ වාර්තා, සහතික කළ බිල්පත්, අරමුදල් ලද මූලාශ්‍රය සහ එය ගිණුම් ගත කිරීමට අදාල ප්‍රතිපත්තිය සහ ලද අනුමැතීන්	මෙම ශේෂ 2016 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂ වන බැවින් ආයතනය සතුව එම ශේෂ සම්බන්ධව තොරතුරු නොමැත.	පැරණි ශේෂ සත්‍යාපනය කිරීම මෙන්ම එසේ කළ නොහැකි ශේෂ අදාල චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ වතුයායන්ට අදාලව 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ රු.96,908,449 ක වෙළඳ වෙනත් ණයගැති කාල විශ්ලේෂණ වාර්තාව අනුව වසර 4-5 ත් අතර සහ වසර 5ට වැඩි ණයගැති ශේෂ පිළිවෙලින් රු.9,233,006 ක් සහ රු.53,749,223 ක්ද ප්‍රධාන කාර්යාලයේ රු.496,460,528 ක වෙළඳ ලැබිය යුතු ශේෂයට අදාළව වසර 3-6 ත් අතර ලැබිය යුතු ශේෂය රු.59,346,049 ක්ද වසර 6 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.68,945,867 ක්ද පාරිභෝගික අංශයේ වසර 5 ඉක්මවූ ණය ප්‍රමාණය රු.11,026,230 ක් බවද නිරීක්ෂණය වූ අතර මණ්ඩලය විසින් මෙම ශේෂ අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ලැබිය යුතු ගිණුම්වල ඇති ශේෂයන් නිවැරදි නොවීමට හේතුවූ කරුණු ලෙස පැවති බදු ගිවිසුම්වල දෝෂ,බදු ගැණුම්කරු වෙත මෙන්ම ගිණුම් අංශය වෙත ක්‍රමානුකූලව මාසිකව/වාර්ෂික ඉන්වොයිස් පත් නිකුත් නොකිරීම, බදු ගිවිසුම්වල සිදුවන වෙනස්කම් පිළිබඳව ගිණුම් අංශය අදාළ අංශය තුලින් ලිඛිතව දැනුවත් නොකිරීම, බදු ගිවිසුම්වල පිටපත් ලබා නොදීම දැක්වීමට හැකිය. 2018 වර්ෂයට අදාළ රු.5,904,575 ක ණය ශේෂය ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් නොලැබෙන බව සහතික කර ඇති බැවින් 2024 දෙසැම්බර් 31 දින එම අගය පොත්වලින් ඉවත් කර ඇත.	හිඟ ශේෂ අයවිය යුතු ආයතන හඳුනාගෙන අයකර ගැනීමට හා අවිනිශ්චිත ශේෂ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයන් සිදු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ වතුයායන්ට අදාලව 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ රු.116,370,690 ක් වූ ණයහිමි කාල විශ්ලේෂණයට අනුව ණයහිමි ශේෂයෙහි, වසර 04-05 ත් අතර රු.13,055,692 ක් සහ වසර 05 ඉක්මවූ රු.73,408,101 ක ණයහිමි ශේෂයක්ද මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ රු.106,220,009 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුළ වසර 01-03 ත් අතර රු.9,703,150 ක් වූ ශේෂයන්ද, වසර 03-06ත් අතර රු.10,852,582	වතුයායන්හි ණයහිමි ශේෂ සත්‍ය වශයෙන්ම පවතිද යන්න සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම සිදුකිරීම හා ආයතනයේ මූල්‍ය තත්ත්වය අනුව ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. ආයතනයේ පවතින දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිගය නිසා මෙම ණයහිමියන් වෙත මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති අතර, මුදල් පවතින	ණයහිමි ශේෂ තහවුරු කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

ක ණයහිමි ශේෂයක්ද වසර 06 ඉක්මවූ රු.73,745,425 ක ශේෂයක්ද පැවතුණි.මෙම ශේෂ තුළ ඇතුළත් රු.15,437,483 ක් වූ වැවිලි මානව සංවර්ධන භාරයට අදාල ශේෂය සහ රු.62,198,341 ක් වූ වරිපනම් හා බදු යන ශේෂයන්ද පැවතුණු අතර එම ශේෂ නිරවුල් කිරීම සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

ආකාරයට වර්තමානය වනවිට මෙම ශේෂය ගෙවාගෙන යාමට කටයුතු කර ඇත.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව.	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සහ වතුයායන් සතුව පවතින දේපල පිරියත හා උපකරණ ශේෂය සම්බන්ධයෙන් වත්කමේ වර්ගය, මිලදී ගත්වටිනාකම,දිනය,වාහන අපහරණය කිරීම්, වාර්ෂිකව සිදු කළ මිලදී ගැනීම්,ඉවත් කිරීම්,මාරුකිරීම් සහ එක් එක් වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි අදාල තොරතුරු ඇතුළත් කර විධිමත්ව සකස් කළ ස්ථාවර වත්කම් ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ගිණුම් අවශ්‍යතාවයන් සඳහා ආයතන විසින් වතු සඳහා හා ප්‍රධාන කාර්යාලය සඳහා වෙන වෙනම ස්ථාවර වත්කම් සම්බන්ධ විස්තර පිළිවෙලින් 1996 වර්ෂය හා 2008 වර්ෂයන් සිට ලේඛනයක් පවත්වාගෙන යන අතර, විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම සිදුකර නොමැත. ඉදිරියේදි නිවැරදි ආකාරයට ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය.
(ආ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 (1) වන උප වගන්තිය	2011 වර්ෂයේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.34,002,171 ක දායක මුදල් ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව භාරකාර අරමුදලට රු.8,306,083 ක ගෙවිය යුතු අධිභාර ශේෂයක්ද විය.	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2002 වර්ෂයේ පමණ සිට EPF/ETF දිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබූ අතර, මුදල් අමාත්‍යාංශයෙන් ඇතැම් වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදී ඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. තවද වර්තමානය වන විට ගෙවිය යුතු සියළු EPF, ETF මුදල් එකවර ගෙවීමට කටයුතු සුදානම් කර ඇත.	පනත ප්‍රකාරව නියමිත දිනයට ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකළ යුතුය.
(ඇ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ 5 (1) උප වගන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට	දිගින් දිගටම ආයතනයේ පවතින කාරක ප්‍රාග්ධන මූල්‍ය දුෂ්කරතා නිසා ආයතනයේ සේවක පාරිතෝෂික මුදල් නිසි පරිදි ගෙවීම සිදු කිරිමට	පනත ප්‍රකාරව පාරිතෝෂික නියමිත කාලයේදී ගෙවීමට කටයුතු

		රු.811,037,849 ක ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයක් සහ රු.279,858,224 ක ගෙවිය යුතු අධිභාර ශේෂයක් ද පැවතුණි.	නොහැකි වී තිබුණි. සියළු පාරිතෝෂික මුදල් එකවර ගෙවීමට කටයුතු සුදානම් කර ඇත.	කළ යුතුය.
(ඇ)	1998 අංක 15 දරන සංශෝධිත සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය	ගෙවිය යුතු අර්ථසාධක ලෙස රු.834,301,079 ක් ද වතු කාර්ය මණ්ඩල අර්ථසාධක සංගමයට (ESPS) සහ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයට (CPPS) රු.163,518,427 ක හිඟ ශේෂයක්ද පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත අරමුදල් සඳහා රු.90,272,881 ක ගෙවිය යුතු අධිභාරයක්ද විය.	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2002 වර්ෂයේ පමණ සිට EPF/ETF දිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබුණි.2023 ජූලි මස සිට වර්තමාන ව්‍යවස්ථාපිත ගෙවීම් ආයතනයේ මුදලින් ක්‍රමානුකූලව ගෙවා ගෙන යනු ඇත.	පනත ප්‍රකාරව නියමිත දිනයට ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකළ යුතුය.
(ඉ)	2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 93 වන වගන්තිය	2023/2024 තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු වාර්තාව 2026 ජනවාරි 01දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ආදායම් වාර්තා ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යැවීම ප්‍රමාද වී ඇත. ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම අවශ්‍ය විම මීට හේතු වී ඇත.	පනත ප්‍රකාරව තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර බදු ගෙවීම සිදු කළ යුතුය.
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතෙහි 6.9 ඡේදය	පාරිභෝගික අංශයේ වසර 05 ඉක්මවූ ණය ශේෂය රු.16,590,553 ක් අතරින් යුධ හමුදාවෙන් අයවිය යුතුව පැවති රු.5,904,575ක ශේෂයක් පොත්වලින් කපා හැරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතුලු ක්‍රියාමාර්ග නොගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි.	මෙම පාරිභෝගික අංශයේ 2018 වර්ෂයට අදාළ රු.6,645,190ක ණය ශේෂය තුළ ඇති රු.5,904,575 ක ශේෂය ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් නොලැබෙන බව සහතික කර ඇති බැවින් 2024 දෙසැම්බර් 31 දින එම අගය පොත්වලින් ඉවත් කර ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව අදාල ක්‍රියාපටිපාටිය අනුගමනය කර ණය ශේෂ කපා හැරීම කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.229,233,137ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු.147,859,712ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,373,425 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම අලාභයේ වැඩිවීමට මණ්ඩලයේ තේ, රබර් සහ අනෙකුත් භෝග වගාවන්ට අදාල විකුණුම් පිරිවැය රු.320,113,670 කින් වැඩිවීමත්, පරිපාලන හා කාර්යයමණ්ඩල පිරිවැය සමස්ථයක් ලෙස රු.35,442,170 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ තේ දළු විකිණීමෙන් ලද ආදායම 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී සියයට 6.5 කින් වැඩි වී තිබූ අතර, රබර් වගාවෙන් ලද ආදායම් 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී සියයට 42 ක් වැඩි වී තිබුණි. එමෙන්ම 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ තේ දළු හා රබර් නිෂ්පාදනයට අදාල පිරිවැය පිළිවෙලින් සියයට 22 කින් හා සියයට 24.5 කින් වැඩිවීමක්ද සිදුවී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී ජංගම අනුපාතය 0.37:1 ක් හා 0.35:1 ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී ක්ෂණික වත්කම් අනුපාතය 0.33:1 ක් හා 0.31:1 ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දළ අලාභ අනුපාතය සියයට 13.5 ක් වූ අතර, පසුගිය වර්ෂයේ දි දළ අලාභ අනුපාතය සියයට 3ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දී ශුද්ධ අලාභ අනුපාතය සියයට 16 ක් වු අතර, පසුගිය වර්ෂයේ දී ශුද්ධ අලාභ අනුපාතය සියයට 11.6 ක් විය.

මණ්ඩලයේ 2023 හා 2024 වර්ෂයන්හි ඉහත සඳහන් අනුපාත පරීක්ෂාවේදී පවතින ජංගම වත්කම් වලින් එහි ජංගම වගකීම් පියවා ගැනීමේ හැකියාවක් නොමැති බවත් හා ආයතනයේ ස්කන්ධ ප්‍රාග්ධනය ඉක්මවූ ණය ප්‍රාග්ධනයක් පවතින බවත්, ඒ අනුව ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවය හා අඛණ්ඩ පැවැත්මේ අවධානම පිළිබඳ විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය කළ හැකි විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික පනත අනුව මණ්ඩලය පිහිටුවීමේ අරමුණු වන කෘෂිකාර්මික, නිෂ්පාදන, වතු කළමනාකරණය, ව්‍යාපාරික, මූල්‍ය හා මෙහෙයුම් යන ක්ෂේත්‍රයන්ට අදාලව ස්ථාපිත කළ අරමුණු හා කාර්යයන් ඵලදායීව ඉටුකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද මණ්ඩලයේ අරමුණු අනුව මණ්ඩලයට පැවරුණු කෘෂිකාර්මික හා වතු ඉඩම් වල ඵලදායීත්වය උපරිම ලෙස ඉහල නැංවීමට විධිමත් සැලසුම් සකස් කර නොතිබුණු අතර තේ හා රබර් වතුයායන් විධිමත් කළමනාකරණයක් සහිතව ලාභදායීව පවත්වාගෙන යැමට ද කටයුතු කර නොතිබුණි.	පිළිගනිමි.	මණ්ඩලයට පැවරුණු වතු ඉඩම්වල ඵලදායීත්වය උපරිම ලෙස ඉහල නැංවීමට සැලසුම් සකස් කර තේ හා රබර් වතු කළමණාකරණයක් සහිතව පවත්වා ගත යුතුය.

(ආ)	නාගස්තැන්න සහ කන්දල්ඔය වතුයායන් වල පිළිවෙලින් රු.1,539,546 ක් හා රු.1,256,046 ක මුදල් සොරා ගැනීම් සිදු වී වසර 13 ක් පමණ ගතවී තිබුණද, පවරා තිබූ නඩු කටයුත්තෙහි වර්තමාන තත්ත්වය සොයා බලා නොතිබූ අතර වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නුවර මහාධිකාරණයේ මෙම නඩුව තවමත් විභාග වෙමින් පවති. 2025 දෙසැම්බර් 11 දින නැවත කැඳවීමට කටයුතු කර ඇත. තවමත් නඩු කටයුතු පවතින බැවින් අලාභය අයකර ගැනිමට නොහැකිව ඇති අතර, ඉදිරි නීතිමය පියවර අනුව කටයුතු කරනු ඇත.	පවරා ඇති නඩු තීන්දු අනුව අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මණ්ඩලයට පැවරී තිබුණු ඉඩම් හෙක්ටයාර 92.84 ක් බදු දීමට 2019 වර්ෂය තුළ ගිවිසුම්ගතවී, ගිවිසුම් ප්‍රකාරව බදුකරුවන් 19 දෙනෙකු වෙත කෘෂිකාර්මික කටයුතු සඳහා වසර 30 ක කාලසීමාවක් සඳහා ඉඩම් බදු දී තිබුණු අතර උක්ත බදු ගිවිසුම් 2021 ජුලි 13 දින අවලංගු කර තිබුණි. නැවත ඉඩම් බදු දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හා නව ගිවිසුමක් අත්සන් නොකර බදු කරුවන් 13 දෙනෙකු වෙත බදු දී තිබුණි. එයින් බදුකරුවන් 07 දෙනෙකු වෙත ඉඩම් හෙක්ටයාර 28.29 ක භුක්තිය භාරදී තිබුණද, තක්සේරු වාර්තා ලබාගෙන බදු අයනොකර අක්කරයක් සඳහා මාසිකව රු.1000 ට වඩා අඩු බදු වටිනාකමක් අය කර තිබුණි. එමෙන්ම බදු ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව බදුකරුවන් 10 දෙනෙකු වෙතින් බදු දුන් දින සිට අයවිය යුතුව තිබුණු රු.4,836,251 ක බදු කුළී වටිනාකමින් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.2,691,292 ක බදු මුදලක් ද අය කරගෙන නොතිබුණි.	මෙම ඉඩම් නිදහස් කිරිම සම්බන්ධයෙන් 2019 වසරේදි අමාත්‍යාංශය විගණන අංශය විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලදී. එම වාර්තාව මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 ජුනි මස 13 වන දින මෙම ව්‍යාපෘතිය නතර කරන ලදී. නමුත් ඉහත ව්‍යාපෘතිය යටතේ බදු ගිවිසුම අත්සන් කර තිබූ සහ ගැටළු රහිතව භුක්තිය ලබා දිය හැකි ඉඩම් කොටස් එම ව්‍යාපෘතිය යටතේම ලබා දීමට ප්‍රධාන විධායක නිලධාරි කටයුතු කරන ඇත. තවද,තක්සේරු වාර්තා පදනම්ව බදු මුදල් අයකර ගැනීමට හා හිඟ බදු මුදල් අයකර ගැනීමටද බදුකරුවන් දැනුවත් කර ඇත.	මුල්බදු ගිවිසුම් අවලංගු කිරීමෙන් පසුව නැවත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත නව බදු ගිවිසුම් ගත වීමෙන් ඉඩම් බදු දිය යුතු අතර නව තක්සේරු මගින් බදු මුදල් අයකර ගැනීමට හා හිග බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයට ගිවිසුම් මඟින් පැවරී තිබුණු හෙක්ටයාර 1,785.10 ක ඉඩම්වලින් වතුයායන් 37කට අදාල හෙක්ටයාර 1,068.24 ක් බදු දී ආදායම් උපයා ගැනීමට හෝ ඵලදායී කාර්යන් සඳහා භාවිතා කර නොතිබුණි.	මණ්ඩලය සතු බදු දිමට ඇති ඉඩම් 2019 වර්ෂයේ දි විශේෂ ව්‍යාපෘති යෝජනා ක්‍රමය යටතේ බදු දිමට සැලසුම් කළද කළමනාකරණයේ වෙනස්විම් මත එම ව්‍යාපෘතිය නැවතුණි. 2022.02.06 දින ඉඩම් බදුදීමට ආයෝජකයින් තෝරා ගැනිමේ අභිලාශය කැඳවා ඉල්ලුම් පත් අනුව ඉඩම් 07ක් බදු පදනම මත ලබාදිමට කටයුතු කරන ලදි. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ඌන උපයෝජිත ඉඩම් බැහැර කිරිමේ ව්‍යාපෘතිය යටතේ මෙම ඉඩම් ද බදු දිමට නියමිතව තිබුණි. පසුව හෙක්ටයාර් 20ට වඩා අඩු ඉඩම් මණ්ඩලය මගින් බදුදිමට තිරණය විය.පසුව 2025.01.29 වන දින ලිපිය මගින් මෙම ඉඩම් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති යටතේ බැහැර කිරිමට තිරණය විය.	පැවරී ඇති ඉඩම්වලින් ආදායම් උපයා ගැනීමට හෝ, ඵලදායී කාර්යන් සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (ආ) ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අංක 32 ශ්‍රී 4264 දරන ජීප් රථය අලුත්වැඩියා කළ යුතු උපාංග 11 ක් හඳුනාගෙන ඇස්තමේන්තුවක් සකස් කිරීමකින් තොරව මිල ගණන් කැඳවා වාහනයේ එංජිම හා ඉංජෙක්ටර් පොම්පය පමණක් අලුත්වැඩියාව සඳහා උපාංග මිලදී ගෙන රු.1,082,820 ක් වැය කර 2024 වර්ෂය අවසාන වන විට ගෙවීම් කර තිබුණි. එමෙන්ම එංජිම අලුත්වැඩියාවෙන් පසු ඉවත් කරන ලද උපාංග ගබඩාවට භාරදී නොතිබුණු අතර අලුත්වැඩියා කළ ජීප් රථය ප්‍රධාන කාර්යාලයට 2025 පෙබරවාරි 17 ලබා දී තිබුණු අතර 2026 මාර්තු 27 වන විටත් වසරකට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.	මෙම රථය 2023 සැප්තැම්බර් 04 දින, 2024 ජුනි 08 සහ 2024 ජූලි 19 යන කාලසීමාවන්හීදී අළුත්වැඩියා කිරීම් 03ක් සිදු කර ඒ සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඉංජිනේරුවරුන් වෙතින් තාක්ෂණික වාර්තා ලබාගෙන තිබුණි.මේ වන විට මෙම ජීප් රථයේ දිරා ඇති කොටස් අළුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත භාර දී ඇත.	අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුවක් සකස් කර අළුත්වැඩියා කිරීම සිදු කළ යුතුය. ඉවත් කරන ලද උපාංග ගබඩාවට භාරදුන්බවට ලිඛිතව තහවුරු කළ යුතුය.